# සංක්ෂිප්තය


රටක ජීවනාලිය අනාගත දරු පරපුරයි රට ජාතිය ගොඩ නැගීමේ භාරදූර ක්‍රියාවලිය පැවරී ඇත්තේ දරුවන්ටය. එම නිසා ජාතියේ දරුවන්ගේ අධ්‍යාපනය සකස් විය යුත්තේ පූර්ණ පෞරුෂ සංවර්ධනයකින් යුත් පුද්ගලයෙක් සමාජයට දායාද කළ හැකි පරිදිය. අතීතයේ සිටම අධ්‍යාපනයට එල්ල වන චෝදනාව නම් අධ්‍යාපනය දරුවන්ට ප්‍රායෝගික කුසලතාවන් ලබා දීමක් නොකරන අතර විභාග කේන්ද්‍රීයව දැඩි ශාස්ත්‍රීය නැඹුරුවකින් සිදු කරන බවයි. මෙයට පිළියම් ලෙස වරින් වර අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සිදු කළ අතර 1998 වර්ෂයේදී උසස් පෙළ සිසුන්ට දිවි පැවැත්ම සඳහා සංවර්ධන ව්‍යාපෘති හඳුන්වා දීම වැදගත් පියවරකි. මෙම ව්‍යාපෘති සිදු කිරීමේදී සිසුන් වියුක්ත චින්තනය මෙහෙයවා නිර්මාණශීලීව නවතාවයකින් ඉගෙනීමට යොමු වූ අතර නායකත්වය සාමූහිකත්වය තීරණ ගැනීම කාර්යක්ෂම හා සැලසුම් සහගත බව වැනි ගුණාංග වර්ධනය කර ගන්නා ලදී.

වර්තමානයේ පාසල් පද්ධතිය තුළ මෙම ව්‍යාපෘති සිදු කිරීමේදී සිසුන් විවිධ වූ ගැටලු හා දුෂ්කරතාවලට මුහුණ දෙන බව පෙනේ. මේ තත්ත්වය තුළ ව්‍යාපෘති හඳුන්වා දීමෙන් බලාපොරොත්තු වූ ප්‍රතිඵල සිසුන්ට අත් නොවන බව පෙනී යයි. මෙය සිසුන්ට පීඩනකාරී ගැටලුවක් වන අතරම අධ්‍යාපන පද්ධතියේ ගුණාත්මක බව හීන වීමට ද මෙම ව්‍යාපෘති කරණයේ බිඳ වැටීම හේතු වේ. එම නිසා කාලීන විසඳුම් ලබා දිය යුතු මෙම ප්‍රශ්නයට හේතු සාධක සෙවීමට අදාළ අධ්‍යයනය දියත් කරන ලදී. මෙහිදී උසස් පෙළ හදාරන සිසුන් ගෙන් විද්‍යා අංශයේ සිසු කණ්ඩායමක් මගින් තොරතුරු හෙළි කර ගැනීමට යොමු වූයේ වැඩිම ගැටලු සහගත තත්ත්වයන්ට ඔවුන් මුහුණ දෙන බව පෙනී ගිය බැවිනි.

මේ අනුව උසස් පෙළ කේවල ව්‍යාපෘති සිදු කිරීමේදී විද්‍යා අංශයේ සිසුන් මුහුණ දෙන ගැටලු හඳුනා ගැනීමේ ප්‍රධාන අරමුණ ඇතිව සමීක්ෂණ පර්යේෂණ ක්‍රමය භාවිතා කරමින් පර්යේෂණය මෙහෙයවන ලදී. අධ්‍යයන නියැදිය දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ මාතර අධ්‍යාපන කලාපයට අයත් ජාතික පාසල් වල විද්‍යා අංශයෙන් 2012 උසස් පෙළ විභාගයට පෙනී සිටීමට නියමිත සිසුන් ගෙන් සරල අහඹු නියැදිකරණය භාවිතා කර සිසු සිසුවියන් 120 ක් තෝරා ගන්නා ලදී. ප්‍රශ්නාවලි, සම්මුඛ සාකච්ඡා

යොදා ගනිමින් ලබා ගන්නා ලද දත්ත ප්‍රමාණාත්මක හා ගුණාත්මක යන විශ්ලේෂණ ප්‍රවේශයන් දෙකම යොදා ගෙන විශ්ලේෂණය සිදු කරන ලදී.

අධ්‍යයනය සිදු කිරීම මගින් උසස් පෙළ කේවල ව්‍යාපෘති වලදී විද්‍යා විෂයය ධාරාව හදාරන සිසුන් මුහුණ දෙන ගැටලු රාශියක් අනාවරණය කර ගැනීමට හැකි වූ අතර එම ගැටලු වලට විසඳුම් යෝජනා ඉදිරිපත් කිරීමට ද හැකිවිය. දරුවන් උපතින් උරුම කරගත් සැඟවී ඇති කුසලතා මතු කර යහපත් පෞරුෂයකින් හෙබි නිර්මාණශීලී විවේචනශීලී ස්වාධීන චින්තනයෙන් යුත් පරිපූර්ණ පුද්ගලයන් බවට පත් කළ යුත්තේ පාසැල් අධ්‍යාපනය තුළිනි. යුගයේ අවශ්‍යතාවයට අනුව එවන් පුරවැසි පිරිසක් බිහි කිරීමට නව ප්‍රතිසංස්කරණ තුළින් හඳුන්වා දුන් දිවි පැවැත්ම සඳහා නිපුණතා සංවර්ධන ව්‍යාපෘති වලදී සිසුන් මුහුණ දෙන ගැටලු සඳහා පිළියම් ඉදිරිපත් කිරීමට මෙම අධ්‍යයනය දිශානුගත කිරීම ව්‍යාපෘති ක්ෂේත්‍රයේ ඉදිරි පැවැත්ම හා ගුණාත්මක සංවර්ධනයට හේතුවක් වනු ඇත.

**ABSTRACT**

The life blood of a nation is its future generation. The responsibility of building the county and the nation lies on their shoulders. Therefore the system of education of a country should be designed in order to build up a child with perfect personality. This has not yet become true in Sri Lanka especially due to the examination oriented education system based on theoretical knowledge instead of providing students with an education based on the improvement of practical skills. In this respect the authorities have implemented different educational reforms from time to time. One important step included in those reforms in 1988 is the introduction of competency development projects for life skills for the advanced level students. With the implementation of these projects students are guided towards creative and innovative learning which will help the students to build up their personal traits like, leadership, working in teams, efficiency in work, decision taking and developing skills in planning and organizing.

Though these projects have been put into practice within the school curriculum at present its evident that these students face difficulties when carrying out their projects. As a result these students have not been able to achieve the expected targets and the aim of the introduction of these projects into the advanced level school curriculum has not been fulfilled. The failure of achieving the expected goals may cause stress in the students minds and also this has caused the reduction of the quality of the system of education. This study has been carried out to identify the reasons of this problem and to take relevant measures to overcome them.

For this study, students of the A/L Science stream have been included because they are the ones who face problems in preparing projects. Accordingly this study has been done with the intention of indentifying the difficulties the A/L Science students face in carrying out their Advanced level single projects. Random sample of 120 students were selected from the A/L science students from the national schools of Matara education zone who have to sit for their A/L

examination in 2012. Date obtained through the questionnaire and the interviews were analyzed using both qualitative and quantitative analyzing approaches.

This study revealed that a significant number of students face difficulties when carrying out their single projects. The study could also enable to present certain solutions to overcome these particular problems. It is school education which could provide a perfect citizen to the society with creative personality armed with independent thinking by improving their inborn skills and talents. To cater to the need of the era, this study has shown the ways to submit solutions for the issues faced by student in their competency skills development projects for living introduced for their improvement of living by the new educational reforms. This study will also be helpful for the development of the field projects and their quality development too.